මැතිවරණ දෙපාර්තමේන්තුව
தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)
தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk*   *e-mail : info@slelections.gov.lk*

| | | |
|---|---|---|
| මගේ අංකය : PE/24/2015<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2015.07.08<br>திகதி |

චක්‍රලේඛ අංක TR/2015/03

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් / දිස්ත්‍රික් ලේකම් වරුන්**

**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

<u>පාර්ලිමේන්තු මැතිවරණය - **2015.08.17**</u>

<u>පොදු 231 ඉන්ධන ඇණවුම් මඟින් ඉන්ධන ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග.</u>

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ඉහත සඳහන් ඡන්ද විමසීමේ මූලික කටයුතු වල නිරත වන නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීමට හා ඡන්ද විමසීමේ දී ඡන්ද පොළ කාර්ය මණ්ඩල ප්‍රවාහනය හා අනෙකුත් රාජකාරී සඳහා යොදා ගනු ලබන රජයේ වාහන සඳහා ණය පහසුකම් යටතේ පොදු 231 ඇණවුම් මඟින් ඉන්ධන ලබා ගැනීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කිරීමට කරුණාකර කටයුතු කරන්න.

(I) අවශ්‍ය ඉන්ධන ඇණවුම් පොත් ගබඩාවෙන් ලබා ගැනීමේදී ඇණවුම්වල සඳහන් අංක පිළිවෙලට පොත් නිකුත් කිරීම හා භාරගැනීම.

(II) පොත් කිහිපයක් එකවර භාවිතා නොකිරීම හා එක් පොතක් අවසන් වූ පසු පමණක් ඊළඟ පොත භාවිතයට ගැනීම.

(III) ඉන්ධන ලබා ගැනීම සඳහා අමුණා ඇති ආකෘතිය පරිදි සකසා ගත් අයදුම්පතක් රියදුරු මහතුන් ලවා සම්පූර්ණ කරවා ගැනීම. (ඇමුණුම - V - 2)

(IV) සිදු කිරීමට තිබෙන රාජකාරියට ප්‍රමාණවත් ඉන්ධන ප්‍රමාණය පමණක් ගණනය කර ලබාදීම (කිසි විටකත් අනවශ්‍ය පරිදි ඉන්ධන නිකුත් කිරීමෙන් වැළකිය යුතුය)

(V) හැකි සෑම විටම ඉන්ධන ලබා ගැනීමට ප්‍රථම ධාවන සටහන් තුලනය කර ඉදිරිපත් කරන ලෙසට රියදුරන් දැනුවත් කරන්න.

(VI) ඉන්ධන නිකුත් කිරීම සඳහා ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, අවශ්‍ය විස්තර එහි ඇතුළත් කිරීම. එසේ ඇතුලත් කරන විස්තර වලට පහත දැක්වෙන තොරතුරුද අඩංගු විය යුතුය. ඉදිරි විගණන කටයුතු වලදී මෙම ලේඛනය අවශ්‍ය වන හෙයින්, ඡන්ද විමසීම නිමවී සති දෙකක් ඇතුළත මෙම ලේඛනය සහකාර මැතිවරණ කොමසාරිස් භාරයට ගැනීමට කටයුතු කරන්න.

__ඉන්ධන නිකුත් කිරීම සඳහා භාවිත කරන ලේඛනයේ සටහන් තබා ගැනීම පිළිබඳ ආදර්ශය__

1. වාහනයේ අංකය
2. වාහනය අයත් ආයතනයේ නම හා ලිපිනය
3. රියදුරු මහතාගේ නම
4. ඉන්ධන ඇණවුම් අංකය
5. ඉන්ධන වර්ගය (ඩීසල්ද / පෙට්‍රල්ද )
6. නිකුත් කරන ඉන්ධන ප්‍රමාණය
7. එන්ජින් ඔයිල්/ බ්‍රේක් ඔයිල්
8. ඉන්ධන ඇණවුම අත්සන් කරන මාණ්ඩලික නිලධාරියාගේ කෙටි අත්සන හා දිනය
9. ඉන්ධන ඇණවුම ලබාගත් රියදුරුගේ අත්සන
10. ඉන්ධන ඇණවුම සම්පූර්ණ කළ නිළධාරියාගේ කෙටි අත්සන

02. ඉන්ධන ඇණවුම් අත්සන් කිරීම නිලධාරීන් දෙදෙනෙකුට හෝ තිදෙනෙකුට සීමා කරන්න. එසේ ඉන්ධන ඇණවුම් අත්සන් කිරීමට බලය දී ඇති නිලධාරීන්ගේ නම්, නිල නාම, රාජකාරී ලිපිනයන් සහ ආදර්ශ අත්සන් ඉන්ධන හල් හිමියන් වෙත කල් වේලා ඇතිව ලබාදිය යුතුවේ.

03. මෙසේ ඇණවුම් මඟින් නිකුත් කරනු ලබන ඉන්ධන ලබා ගැනීම සඳහා වාහනයේ රියදුරු සමඟ සෑම විටම කළමනාකරණ සහකාර නිලධාරියෙකු හෝ වෙනත් සුදුසු නිලධාරියෙකු යැවිය යුතුය. අදාළ නිලධාරියා ඉදිරිපිටදී වාහනයේ ටැංකියට ඉන්ධන පිරවූ බවට ඇණවුමේ වම්පස ඉහළ කෙළවරේ සටහනක් යෙදිය යුතු අතර එම සටහන පහත ආදර්ශ පරිදි රබර් මුද්‍රාවකින් තැබීමට කටයුතු කළ හැක.

| | | |
|---|---|---|
| මා ඉදිරියේදී අංක ........................................ දරණ වාහනයේ ඉන්ධන ටැංකියට පෙට්‍රල් / ඩීස<br>ඉන්ධන ලීටර්.................. ක් පුරවන ලදී.<br>මයිලෝ මීටරයේ කියවීම. | | |
| ...................... | ............................. | ......................... |
| දිනය | වේලාව | අත්සන |

04. සංචිත වාහන වලට (Pool Vehicles) මෙන්ම නිලධාරීන් විසින් රැගෙන එන වෙන්කළ වාහන (Assigned Vehicles) සඳහාද ඉන්ධන ලබාදීමේදී මෙම විධිවිධානයන් අනුගමනය කළ යුතු බව කාරුණිකව සළකන්න.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්

පිටපත් : 1. අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)
2. විගණකාධිපති - දැනගැනීම සඳහා
3. ප්‍රධාන ගණකාධිකාරී - අවශ්‍ය කටයුතු සඳහා
4. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - අවශ්‍ය කටයුතු සඳහා
5. ගණකාධිකාරී (ප්‍රසම්පාදන) - ඒ ඒ දිස්ත්‍රික්ක වෙතින් ඇණවුම් කරනු ලබන ඉන්ධන ලේඛන ප්‍රමාණය ලබාදීමට
6. ගණකාධිකාරී (ගෙවීම්) - අවශ්‍ය කටයුතු සඳහා


මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
e-mail : comelesl@sltnet.lk

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி : 011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
e-mail : admin@slelections.gov.lk

පරිපාලන නිලධාරී
நிருவாக அலுவலர்
දුරකථන/தொலைபேசி : 011-3083371
ෆැක්ස්/தொலைநகல் : 011-3083371
e-mail : info@slelections.gov.lk

## පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17

## පොදු 231 ඉන්ධන ඇනවුම් මගින් සංචිත වාහන වලට / නිලධාරීන් රැගෙන එන වෙන්කල වාහන වලට ඉන්ධන නිකුත් කිරීම.

01. වාහන අංකය : ................................................................................................

02. වාහනය අයත් ආයතනය : ...................................................................................

03. මාණ්ඩලික නිලධාරියෙකු රැගෙන එන වාහනයක් නම්

(I) නිලධාරියාගේ නම : ..........................................................................................

(II) තනතුර : .........................................................................................................

04. රියදුරුගේ නම : .................................................................................................

05. මයිලේජ් මීටරය කියවීම : ...................................................................................

06. අවශ්‍ය ඉන්ධන වර්ගය (පෙට්‍රල් ද ඩීසල් ද යන්න) : ........................................................

07. ඉන්ධන දැවීම ලීටරයට කිලෝමීටර් : ..........................................................................

08. දැනට ටැංකියේ ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් : .........................................................

09. ටැංකියේ මුළු ඉන්ධන ධාරිතාවය ප්‍රමාණය ලීටර්: ........................................................

10. ඉල්ලුම් කරනු ලබන ඉන්ධන ප්‍රමාණය ලීටර් : ........................................................

ඉහත අංක දරණ වාහනයට ඉන්ධන ලීටර් * පෙට්‍රල් / ඩීසල් ..................... ක් ලබාදෙන්න.

නම : ..............................................

තනතුර :.............................................

අත්සන :............................................

දිනය : ..............................................

.................................................................................................................................

### කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

අංක ................................ දරණ වාහනයට ඉන්ධන * පෙට්‍රල් / ඩීසල් ලීටර් .......... ක් නිකුත් කිරීම * අනුමත කරමි / ඉන්ධන ඉල්ලීම අනුමත නොකරමි.

.....................................................

සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන)

ඉන්ධන ඇණවුම් අනුමත කිරීමට බලයලත් නිලධාරියා

ඉහත අංක දරණ වාහනයට ඉන්ධන ලීටර් ...................... ක් ලබා ගැනීමට අංක ............................ දරණ ඇණවුම නිකුත් කරන ලදී.

...............................................

දිනය : ..................................

ප්‍රවාහන අංශයේ කාර්ය මණ්ඩල නිලධාරී